

# විශ්‍රාම වැටුප

# අන්තර්ගතය

1. හැදින්වීම
2. නෛතික රාමුව
3. විශ්‍රාම වැටුප සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය
4. සේවා විශ්‍රාම වැටුප සහ දුබලතා විශ්‍රාම වැටුප
5. දුබලතා විශ්‍රාම වැටුප
6. මරණ පාරිතෝෂිකය
7. යැපීම් දීමනාව
8. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම

# හැඳින්වීම

විශ්‍රාම වැටුප් හිමි තනතුරක් යයි ප්‍රකාශ කරන ලද රාජ්‍ය සේවාවට ඇතුළත් වූ ද ස්ථිර ධූරයක් දරන ආණ්ඩුවේ සෑම සේවකයෙකුම විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇත.

# නෛතික රාමුව

නාවික හමුදා පුද්ගලයන්ගේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික දීමනාවන් සැකසීම 1981 සංශෝධිත නාවික හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය සහ වරින් වර නිකුත් කරනු ලබන එහි සංශෝධනයන්ට අනුව සිදු කරනු ලබන අතර, එය **1981 සැප්තැම්බර් 01 වන දින සිට බල පැවැත්වේ**.

# විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රධාන කොටස් තුනකින් යුක්තවේ

## පළමු කොටස

නිලධාරීන් / කාන්තා නිලධාරිණියන් ගේ විශ්‍රාම වැටුප / පාරිතෝෂිකය / දුබලතා විශ්‍රාම වැටුප සැකසීම සහ යැපෙන්නන්ගේ දීමනාව සැකසීම සම්බන්ධයෙන් නියෝගයන් ඇතුලත්ව ඇත.

## දෙවන කොටස

නාවිකයන් සහ කාන්තා නාවිකයන්ගේ විශ්‍රාම වැටුප / පාරිතෝෂිකය / දුබලතා විශ්‍රාම වැටුප සහ යැපෙන්නන්ගේ දීමනාව ගෙවීම් කිරීම සම්බන්ධයෙන් නියෝගයන් ඇතුලත්ව ඇත.

## තෙවන කොටස

විශ්‍රාම වැටුප් සැකසීමට අදාල පොදු උපදෙස් ඇතුලත්ව ඇත.

# විශ්‍රාම වැටුප් සැකසීම සඳහා බලපැවැත්වෙන අනෙකුත් ව්‍යවස්ථාපිත නියෝගයන්

1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ.

2. අමාත්‍ය මණ්ඩල සංදේශ.

3. නාවික හමුදා පනත.

4. විශ්‍රාම වැටුප් චක්‍රලේඛන.

5. නාවික හමුදාධිපතිගේ නාහ. 5 සංදේශ

# විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයට අනුව නාවික පුද්ගලයින් වෙත ලැබෙන ප්‍රතිලාභ

1. විශ්‍රාම වැටුප සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය
2. සේවා හා දුබලතා විශ්‍රාම වැටුප
3. දුබලතා විශ්‍රාම වැටුප
4. පාරිතෝෂිකය
5. මරණ පාරිතෝෂිකය
6. යැපෙන්නන්ගේ දීමනාව
7. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප

# නිලධාරින් / නිලධාරිණියන් හට විශ්‍රාම වැටුප් ලැබීමට තිබිය යුතු සේවා කාලය

1. නිලධාරින් - වසර 20 (අවම සේවා කලාය)

2. නිලධාරිණියන් - වසර 15

3. නිලධාරියෙකුගේ වයස අවුරුදු 55 දක්වා සහ කාන්තා නිලධාරිණියකගේ වයස අවුරුදු 45 දක්වා සේවයේ යෙදී සිටිමට අවකාශ ඇත.

4. කෙසේ වුවද නිලධාරියෙකු වයස අවුරුදු 55 දී සහ කාන්තා නිලධාරිණියක් වයස අවුරුදු 45 දී අනිවාර්යයෙන්ම විශ්‍රාම ගත යුතුය

5. තවද පහත සදහන් ස්ථිර නිලයක් දරණ නිලධාරියෙකු එම කාලසීමාව ඇතුලත ඊළග උසස් නිලයට උසස් කරනු ලැබුවහොත් මිස එම කාලසීමාව අවසානයේදී විශ්‍රාම ගත යුතුය. නිලධාරියෙකු වයස අවුරුදු 50 වන විට ස්ථිර කොමාණ්ඩර් නිලයට උසස් කරනු නොලැබුවහොත් ඔහු විශ්‍රාම ගත යුතුය.

| ස්ථිර නිලය | කාලසීමාව (අවුරුදු) |
|---|---|
| උප ලුතිනන් | 06 |
| ලුතිනන් | 11 |
| ලුතිනන් කොමාණ්ඩර් | 10 |
| කොමාණ්ඩර් | 08 |
| කපිතාන් | 05 |
| කොමදෝරු | 04 |
| රියර් අද්මිරාල් | 03 |

6. 1981 නාවික හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයේ 3 (2) (ආ) අනුව ඉහත දක්වා ඇති කාලසීමාවට හෝ නියමිත වයස් සීමාවට වඩා වැඩි කාලයක් නිලධාරියකුගේ හෝ කාන්තා නිලධාරිණියකගේ සේවය නාවික හමුදාවේ යහපත සදහා අවශ්‍ය වේ යයි ජනාධිපතිවරයා විසින් අදහස් කරනු ලැබුවහොත් නාවික හමුදාධිපතිගෙන් විමසීමෙන් පසුව ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය මත සේවයේ යොදවා ගැනීමට හැකියාවක් ඇත.

# නාවිකයන් සහ කාන්තා නාවිකයන් හට විශ්‍රාම වැටුප් ලැබීමට තිබිය යුතු සේවා කාලය

1. නාවිකයන් - වසර 22

2. කාන්තා නාවිකයන් - වසර 15

3. ඉහත සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු නාවිකයන් සහ කාන්තා නාවිකයන් අනිවාර්‍යයෙන්ම විශ්‍රාම ගත යුතුය වේ.

4. කෙසේ වෙතත් නැවියකු වයස අවුරුදු 55 දී විශ්‍රාම යා යුතුය.

# විශ්‍රාම වැටුප් ගණනය කිරීමට යොදා ගන්නා වැටුප් හා දීමනා

**නිලධාරීන්**

මාසික ඒකාබද්ධ වැටුප
සලාක දීමනාව (පවතින වර්ෂයේ)
සුදුසුකම් දීමනාව

**නාවිකයන්**

මාසික ඒකාබද්ධ වැටුප
සලාක දීමනාව (පවතින වර්ෂයේ)
සුදුසුකම් දීමනාව
යහපත් හැසිරීමේ ලාංඡන දිමනාව
නැවත සේවයට බැඳීමේ දීමනාව

# විශ්‍රාම වැටුප සකසන ආකාරය

1. යම් බඳවා ගැනීමකට අයත් නාවික පුද්ගලයින්ගේ වසර 22 සේවා කාලය සම්පූර්ණ වීමට පෙර නාවික පොදු සංඥාවක් නිකුත් කරණු ලැබේ.

2. එම සංඥාවේ උපදෙස් ප්‍රකාරව විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිකය ලබා ගැනීමට පහත දක්වා ඇති ලිපි ලේඛණ අධ්‍යක්ෂ නාවික පුද්ගල වෙත ඉදිරිපත් කල යුතුය.

අ. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මාර්ගගත පද්ධතියේ ඇතුලත් PD 3 අයදුම්පත මාර්ගගත පද්ධතිය (Online) මගින් නාවික විශ්‍රාම වැටුප් අංශය වෙත යොමු කිරිමෙන් පසු එම අයදුම්පතේ දෘඩ පිටපත් 02 ක්.

ආ. විශ්‍රාම වැටුප් ආකෘතිපත්‍රය (අංක. 01) පිටපත් 04 ක්.

ඈ. නාවික හමුදාව වෙත යම් අයකර ගැනීමක් ඇත්නම් එම අයකර ගැනීම විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිකයෙන් අයකිරිමට කැමැත්ත ප්‍රකාශ කරන ලද දිවුරුම් ප්‍රකාශයේ පිටපත් 02 ක්.

ඇ. අංශභාර නිලධාරි විසින් සහතික කරන ලද අදාළ නාවිකයාගේ ජාතික හැදුනුම්පතේ ඡායාස්ථිත පිටපත් 02 ක්.

ඉ. අංශභාර නිලධාරි විසින් සහතික කරන ලද අදාළ නාවිකයාගේ බැංකු ගිණුමේ ඡායාස්ථිත පිටපත් 02 ක් (රාජ්‍ය බැංකු පමණක් වියයුතුයි).

3. අධ්‍යක්ෂ නාවික පුද්ගල/ ආඥාපති ස්වේනාහමු වෙතින් නිම සේවා ගැන්වීමට මාස 03 කට පෙර ඉහත සදහන් කර ලිපි ලේඛණ නාවික විශ්‍රාම වැටුප් අංශය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

4. ඒ අනුව නාවික වැටුප් අංශය වෙතින් වැටුප් වාර්ථාවන් ලබා ගැනීම සිදු කරන අතර වැටුප් පත්‍රිකාවෙහි ඇතුලත් දත්තයන් සහ PD 3 ආකෘතිපත්‍රයෙහි ඇතුලත් දත්තයන් නැවත පරික්ෂා කිරීම සිදු කරනු ලබයි.

5. නිම සේවා සංඥාව නිකුත්වීමෙන් පසුව සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (ගබඩා පාලන) මගින් අවසන් වාර්ථා ලැබීමෙන් අනතුරුව රජය වෙත යම් අයකර ගැනීමක් වෙතොත් එයද PD 3 මාර්ගගත අයදුම්පතට ඇතුලත් කර එම අයදුම්පත මාර්ගගත පද්ධතිය යටතේ (Online) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

6. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙතින් අදාල දත්තයන් පරික්ෂාවට ලක් කර විෂමතාවයන් නොමැති නම් විශ්‍රාම වැටුප් අංකය නිකුත් කර මාර්ගගත පද්ධතිය මගින් නාවික විශ්‍රාම වැටුප් අංශය දැනුවත් කරන අතර දූරකථන කෙටි පණිවිඩ මගින් විශ්‍රාමික පුද්ගලයින් දැනුවත් කරණු ලැබේ.

7. තවද ඒ සමගම විශ්‍රාම වැටුප ලබා ගැනිමට අදාල සම්මුඛ පරික්ෂණ දිනයද එම ක්‍රමය යටතේම ලබා දෙනු ලබයි.

8. මෙම ක්‍රියාවලිය සිදුවන අවස්ථාවේදී පහත දක්වා ඇති ලිපි ලේඛණ අදාල නාවික පුද්ගලයා විසින් නාවික විශ්‍රාම වැටුප් අංශය වෙත ලබාදිය යුතුය.

අ. විශ්‍රාමිකයාගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත් 02 යි.

ආ. විශ්‍රාමිකයාගේ ජාතික හැඳුනුම්පතේ සහතික කරන පිටපත් 02 යි.

ඇ. කාලාත්‍රයාගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත් 02 යි.

ඇ. විවාහ සහතිකයේ මුල් පිටපත් 02 යි.

ඉ. පෙර විවාහයක් පැවතියේ නම් එම විවාහයෙන් දික්කසාද වූ බව සනාථ කිරිම සදහා අධිකරණය මගින් ලබාදෙන නෛසයිතික සහ නියත තින්දුවල මුල් පිටපතක් සහ ඡායාස්ථික පිටපතක්.

ඊ. කලාත්‍රයාගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික කළ පිටපත් 02 යි.

උ. දරුවන්ගේ උප්පැන්න සහතික වල මුල් පිටපත් 02 යි.

ඌ. කලාත්‍රයා මියගොස් ඇත්නම් මරණ සහතිකයේ මුල් පිටපත් 02 යි.

එ. නම් වල වෙනස්කම් පවතිනම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක් සහ එහි ඡායා පිටපතක්.

ඒ. ග්‍රාම නිලධාරිගෙන් ලබා ගන්නා ලද පදිංචිය පිලිබඳ සහතිකය ( DS 4 ) සහ එහි ඡායා පිටපතක්.

9. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙතින් විශ්‍රාම වැටුප් අංකය ලැබීමෙන් පසු අදාල ලිපි ලේඛණ / සහතිකපත් වල පිටපත් 01 බැගින් සහ විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීමට අදාල ප්‍රධාන පත්‍රයද සමගින් ගෙවීම් ආරම්භ කල දින සිට මාස 03 ක් ඇතුළත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

10. එම ලිපියේ පිටපතක් විශ්‍රාමිකයාටද ඉදිරිපත් කරනු ඇත.

## වසර 22 ක සේවා කාලයක් සම්පූර්ණ කර සේවයෙන් ඉවතව යන නාවික පුද්ගලයෙකුගේ විශ්‍රාම වැටුප ගණනය කිරීම

| | | | |
|---|---|---|---|
| මාසික ඒකාබද්ධ වැටුප | රු. | - | 32,089.00 |
| සළාක දීමනාව | රු. | - | 19,350.60 |
| ය.හැ.ළා දීමනාව | රු. | - | 600.00 |
| සුදුසුකම් වැටුප | රු. | - | 425.00 |
| නැවත සේවයට බැදීමේ වැටුප | රු. | - | 300.00 |
| එකතුව | රු. | - | 52,764.60 |

විශ්‍රාම වැටුප් ප්‍රතිශතය 85%

පරිවර්තනයට පෙර මාසික විශ්‍රාම වැටුප = 52,764.60 x 85% = Rs.44,849.91

පරිවර්තනයට පසු මාසික විශ්‍රාම වැටුප = 52,764.60 x 75% = Rs.39,573.45

විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය 52,764.60 x 85% x 24 = Rs.1,076,397.84

# සේවා කාලය වසර 20 ක් සම්පූර්ණ කර තම ඉල්ලීම මත සේවයෙන් ඉවත්ව යන නිලධාරියෙකුගේ විශ්‍රාම වැටුප ගණනය කිරීම

| | | | |
|---|---|---|---|
| මාසික ඒකාබද්ධ වැටුප | රු. | - | 71,407.00 |
| සලාක දීමනාව | රු. | - | 23,231.10 |
| සුදුසුකම් වැටුප | රු. | - | 637.50 |
| එකතුව | රු. | - | 95,272.60 |

විශ්‍රාම වැටුප් ප්‍රතිශතය 80%

පරිවර්තනයට පෙර මාසික විශ්‍රාම වැටුප = 95,272.60 x 80 % = Rs.76,218.08

පරිවර්තනයට පසු මාසික විශ්‍රාම වැටුප = 95,272.60 x 70% = Rs.66,690.82

පරිවර්ථිත පාරිතෝෂිකය = 95,272.60 x 80% x 24 = Rs.1,829,233. 92

# සේවා කාලය වසර 15 ක් සම්පූර්ණ කර සේවයෙන් ඉවත්ව යන නිලධාරිණියකගේ විශ්‍රාම වැටුප ගණනය කිරීම

| | | | |
|---|---|---|---|
| මාසික ඒකාබද්ධ වැටුප | රු. | - | 71,407.00 |
| සලාක දීමනාව | රු. | - | 23,231.10 |
| සුදුසුකම් වැටුප | රු. | - | 637.50 |
| එකතුව | රු. | - | 95,272.60 |

විශ්‍රාම වැටුප් ප්‍රතිශතය 78%

පරිවර්තනයට පෙර මාසික විශ්‍රාම වැටුප = 95,272.60 x 78 % = Rs.74,312.63

පරිවර්තනයට පසු මාසික විශ්‍රාම වැටුප = 95,272.60 x 68% = Rs.64,785.37

පරිවර්ථිත පාරිතෝෂිකය = 95,272.60 x 78% x 24 = Rs.1,783,503. 07

# විශ්‍රාම වැටුප් ගණනයක් සිදු කිරීමේදී විශ්‍රාම වැටුප් ප්‍රතිශතය සකසන ආකාරය

1. විශ්‍රාම වැටුප් පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රාහයට අනුව නිලධාරියෙකුගේ විශ්‍රාම වැටුප් ප්‍රතිශතය වසර 10 දී 55% ලෙසත් නාවිකයෙකුගේ විශ්‍රාම වැටුප් ප්‍රතිශතය වසර 12 දී 60% ක් ලෙසටත් ආරම්භවේ.

2. <u>විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 6/2010</u> ට අනුව ත්‍රස්ථවාදී යුද්ධය නිමකළ <u>2009.05.19</u> දිනට සේවයේ යෙදී සිටි නිලධාරියෙකු වසර 20 ක සේවා කාලයක් සම්පූර්ණ කර සේවයෙන් විශ්‍රාම ගන්වන අවස්ථාවක ඔහුට හිමි විශ්‍රාම වැටුප් ප්‍රතිශතය වන 65% ට 15% ක අතිරේක ප්‍රතිශතයක් එක්කර ගණනය කරනු ඇත.

3. නිලධාරියෙකු හට 85% ක පූර්ණ විශ්‍රාම වැටුප් හිමිකම් ලැබීමට අවම වසර 22 ක සේවා කාලයක් සපුරා තිබිය යුතුය.

4. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 6/2010 ට අනුව ත්‍රස්ථවාදී යුද්ධය නිමකළ 2009.05.19 දිනට සේවයේ යෙදී සිටි නාවිකයෙකු වසර 22 ක සේවා කාලයක් සම්පූර්ණ කර සේවයෙන් විශ්‍රාම ගන්වන අවස්ථාවක ඔහුට හිමි විශ්‍රාම වැටුප් ප්‍රතිශතය වන 70% ට අතිරේක 15% ක ප්‍රතිශතයක් එක්කර 85% ක පූර්ණ විශ්‍රාම වැටුපක් ගණනය කරනු ඇත.

5. ඉහත දක්වා ඇති විශ්‍රාම වැටුප් චක්‍රලේඛයට අනුව වසර 15 ක් සම්පූර්ණ කර සේවයෙන් විශ්‍රාම ගන්වනු ලබන කාන්තා නිලධාරිණියක් හෝ කාන්තා නාවිකයෙක් හට සේවා කාලයට හිමි ප්‍රතිශතයට අතිරේක 15 % ප්‍රතිශතයක් එක්කර විශ්‍රාම වැටුප ගණනය කරනු ඇත.

6. තවද 2009.05.19 වන දිනට පෙර සේවයෙන් විශ්‍රාම ගොස් ඇති නාවික පුද්ගලයෙකුගේ ක්‍රියාන්විත සේවා කාලය වසර 05 ක් ඇත්නම් ඉහත දක්වා ඇති අතිරේක ප්‍රතිශතයන් මත හෝ වසර 22 ක් සම්පූර්ණ කර ඇත්නම් 85% ක ප්‍රතිශතය මත විශ්‍රාම වැටුප සංශෝධනය කරන ලදි.

7. 2019.05.19 වන දිනෙන් පසුව සේවයට බැදෙන නාවික පුද්ගලයින් හට ඉහත දක්වා ඇති ප්‍රතිශත ගණනය කිරීම් අදාළ නොවේ.

## 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ගනු ලබන නාවිකයෙකුගේ 2020 වර්ෂයේදී විශ්‍රාම වැටුප සංශෝධනය වන ආකාරය

1. 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ලැබූ සහ විශ්‍රාම යන නාවික පුද්ගලයින්ගේ විශ්‍රාම වැටුප් 2020 වර්ෂයේදී සංශෝධන කිරිමේදී මූලික වැටුපේ වැඩිවීම පමණක් ලබාදීම සිදු කරනු ලබන අතර එහිදී විශ්‍රාම වැටුප් සහිත දීමනාවන්ගේ වෙනසක් සිදු නොවේ.

2. මෙහිදී හිඟ පාරිතෝෂික මුදල් ගෙවීමකින් තොරව විශ්‍රාම වැටුප සංශෝධනයන් කිරිම සිදු කරනු ලබයි.

සැයු- 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම යනු ලබන නාවික පුද්ගලයන් හට ප්‍රාදේශීය ලේකම් කාර්‍යාලය මගින් ජීවන වියදම් දිමනාව වන රු.3525.00 ක මුදල පමණක් ගෙවීම් කරනු ලබන අතර අන්තර්දිමනාව වන රු.3500.00 මුදල ගෙවීම් කිරීම සිදු කරනු නොලැබේ.

# විශ්‍රාම වැටුප සහ පාරිතෝෂික දිමනාව ගෙවීම් කිරීම අත්හිටුවිය හැකි අවස්ථා

1. විෂමාචාරි කටයුත්තක් කිරීම හේතුවෙන් අවමන් සහිතව සේවයෙන් පහ කිරීම.

2. රාජද්‍රෝහි වූ අවස්ථාවක.

3. විශ්‍රාම වැටුපක් ලද පුද්ගලයෙකු බන්ධනාගාර ගත කිරීමේ දඬුවම ප්‍රධානය කිරීමේදී විශ්‍රාම වැටුප අත්හිටුවීම කල යුතු අතර බන්ධනාගාරයෙන් නිදහස් වූ පසු නැවත විශ්‍රාම වැටුප් ගෙවීම් කළ යුතුය.



# විශ්‍රාම වැටුප් අයදුම්පත් සම්පූර්ණ කිරීමේදි නාවික පුද්ගලයින් විසින් සිදු කරනු ලබන වැරදි

1. ජාතික හැදුනුම්පත් අංකය පැහැදිලිව සටහන් නොකිරිම සහ වැරදි අංකයන් සදහන් කිරිම.

2. ජාතික හැදුනුම්පතෙහි අපහැදිලි ඡායා පිටපත් ඉදිරිපත් කිරිම.

3. ඉපලෝගම රණජයපුර නිවාස ලබාගෙන තිබේනම් ඉපලෝගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුල පිහිටි ඉපලෝගම ලංකා බැංකු ශාඛාවේ ගිණුම් විස්තර ඉදිරිපත් නොකිරිම.

4. ජාතික ඉතිරිකිරිමේ බැංකුව මගින් විශ්‍රාම වැටුපෙන් ගෙවිම් කිරිමට හැකිවන සේ ලබාගෙන ඇති ණය සම්බන්ධයන් වූ ගිණුම් විස්තර ඉදිරිපත් නොකිරිම.

5. විශ්‍රාම වැටුප් අයදුම්පත් අපහැදිලි ලෙස සම්පූර්ණ කිරිම.

# සේවා හා දුබලතා විශ්‍රාම වැටුප

1. නාවික හමුදා සේවා ගණනිය සේවා කාලය වසර 10 /12 ක් සම්පූර්ණ කර ඇති පිලිවෙලින් නිලධාරියෙකු / නාවිකයෙකු රාජකාරියේ යෙදී සිටියදී හෝ රාජකාරියට සම්බන්ධවීමක් හේතුකොට ගෙන දුබලතාවයට පත්වන අවස්ථාවකදී සේවා හා දුබලතා විශ්‍රාම වැටුප ලබා ගැනීමට හිමිකම් ඇත.

2. තවද එම දුබලතාවය නාවික සේවයට සම්බන්ධ බවට නාවික හමුදාධිපතී විසින් පත්කරණු ලබන වෛද්‍ය මණ්ඩලයක් විසින් හෝ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සනාථ කලයුතු අතර නාවික හමුදාධිපති විසින් අනුමත කල කිරිම සිදුකල යුතුය.

3. අදාල දුබලතා ප්‍රතිශතය 20% ක් හෝ ඊට වැඩිනම් පමණක් දුබලතා විශ්‍රාම වැටුපට හිමිකම් ලබයි.

# වසර 13 ක් සම්පූර්ණ කර වෛද්‍ය හේතූන් මත සේවයෙන් ඉවත්වන නාවික පුද්ගලයෙකුගේ විශ්‍රාම වැටුප ගණනය කිරීම

| | | | |
|---|---|---|---|
| මාසික ඒකාබද්ධ වැටුප | රු. | - | 32,089.00 |
| සලාක දීමනාව | රු. | - | 19,350.60 |
| ය.හැ.ලා දීමනාව | රු. | - | 81.00 |
| සුදුසුකම් වැටුප | රු. | - | 425.00 |
| එකතුව | රු. | - | 51,945.60 |

විශ්‍රාම වැටුප් ප්‍රතිශතය 61%

පරිවර්තනයට පෙර මාසික විශ්‍රාම වැටුප = 51,945.60 x 61% = Rs.31,686.16

පරිවර්තනයට පසු මාසික විශ්‍රාම වැටුප = 51,945.60 x 51% = Rs.26,492.26

පරිවර්ථිත පාරිතෝෂිකය 51,945.60 x 85% x 24 = Rs.760,467.84

# දුබලතා විශ්‍රාම වැටුප

1. ගණිතිය සේවා කාලය වසර 10 /12 ක් සම්පූර්ණ කර නොමැති පිලිවෙලින් නිලධාරියෙකු / නාවිකයෙකු රාජකාරියේ යෙදී සිටියදී හෝ රාජකාරියට සම්බන්ධවීමක් හේතුකොටගෙන දුබලතාවයට පත්වන අවස්ථාවකදී වෛද්‍ය හේතුන් මත සේවයෙන් ඉවත් කිරීම හේතුවෙන් ඔහු වෙත දුබලතා විශ්‍රාම වැටුපක් පමණක් ලබා ගැනීමට හිමිකම් ඇත.

2. තවද එම දුබලතාවය නාවික සේවයට සම්බන්ධ බවට නාවික හමුදාධිපති විසින් පත්කරණු ලබන වෛද්‍ය මණ්ඩලයක් විසින් හෝ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සනාථ කිරිම සහ නාවික හමුදාධිපති විසින් අනුමත කිරිම සිදුකල යුතුය.

3. තවද අදාල දුබලතා ප්‍රතිශතය 20% කට වැඩිනම් පමණක් දුබලතා විශ්‍රාම වැටුපට හිමිකම් ලබයි.

4. ත්‍රස්ථවාදී ක්‍රියා හේතුවෙන් පමණක් දුබලතාවයට පත්වූ නාවික පුද්ගලයින් සදහා ඉහත වසර 10/12 ක සේවා කාලය නොමැති වුවත් වසර 10/12 ක සේවාකාලයක් සේවයේ යෙදී සිටියා සේ සලකා සේවා විශ්‍රාම වැටුපක්ද ගෙවීම් කරණු ලැබේ.

# පාරිතෝෂිකය ගෙවීම් කිරීම

තමාට පාලනය කරගත හැකි හේතු මත ඇතිවන අකාර්යක්ෂමතාව නිසා හෝ විෂමාචාර නිසා හෝ අපකීර්තිය ඇතිව හෝ නොව වෙනත් හේතුවක් මත නැව්යෙකු අස්කරන ලද අවස්ථාවකදී අස් කිරීමට සිදුවීමට පෙරාතුවම වූ වර්ෂ 10 කට අඩු නොවූ ගණන් ගතහැකි සේවා කාලයක් ඇත්නම් අස්කරන ලද දිනයේ ඔහු ලැබූ මාසික වැටුප සහ විශ්‍රාම වැටුප් සහිත දීමනා පදනම් කර ඔහු සේවය කර ඇති එක් එක් වර්ෂය වෙනුවෙන් පාරිතෝෂිකයක් ගෙවීමට හිමිකම් ඇත.

# වසර 10 ක් සම්පූර්ණ කර සේවයෙන් ඉවත්ව යන නාවික පුද්ගලයින්ගේ පාරිතෝෂිකය ගණනය කිරීම

| | | | |
|---|---|---|---|
| මාසික ඒකාබද්ධ වැටුප | රු. | - | 31,407.00 |
| සලාක දීමනාව | රු. | - | 19,350.10 |
| සුදුසුකම් දීමනාව | රු. | - | 425.00 |
| එකතුව | රු. | - | 51,182.10 |

පාරිතෝෂිකය ගණනය කිරීම - රු. 51,182.10 x 10 = 511,820.00

# වසර 12 ක් සම්පූර්ණ කර සේවයෙන් ඉවත්ව යන නාවික පුද්ගලයින් ගේ පාරිතෝෂිකය ගණනය කිරීම

| | | | |
|---|---|---|---|
| මාසික ඒකාබද්ධ වැටුප | රු. | - | 31,407.00 |
| සලාක දීමනාව | රු‘ | - | 19,350.10 |
| සුදුසුකම් දීමනාව | රු. | - | 425.00 |
| එකතුව | රු. | - | 51,182.10 |

පාරිතෝෂිකය ගණනය කිරීම - රු. 51,182.10 x 12 = 614,185.20

# මරණ පාරිතෝෂිකය

1. වසර 05 ක අවම සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නාවික පුද්ගලයෙකු සේවයේ යෙදී සිටියදී මියයන අවස්ථාවක ඔහු වසර 12 ක් සේවයේ යෙදී සිටියාසේ සලකා මරණ පාරිතෝෂිකය ගණනය කරනු ලැබේ.

2. තවද වසර 10/12 සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු හෝ නාවිකයෙකු සේවයේ යෙදී සිටියදී මියයන අවස්ථාවක විශ්‍රාම වැටුප් ප්‍රතිශත වගුව භාවිතා කර ඔහුගේ සේවා කාලය අනුව මරණ පාරිතෝෂිකය ගණනය කරනු ලැබේ.

3. විවාහක නාවික පුද්ගලයෙකු මියයන අවස්ථාවේ මරණ පාරිතෝෂිකය විවාහක බිරිඳට කොටසක් සහ ඉතිරි කොටස බාලවයස්කාර දරුවන් වෙත සම කොටස් වශයෙන් බෙදා වෙන්කර බාලවයස්කාර ස්ථාවර තැන්පතු විවෘත කර දරුවන්ගේ වයස අවුරුදු 18 දී ලබාදීමට කටයුතු කරනු ලබයි.

4. අවිවාහක නම් දෙමාපියන් වෙත සම කොටස් වශයෙන් ගෙවනු ලබයි.

## වසර 05 ක් සම්පූර්ණ කර සේවයේ යෙදී සිටියදී මියයන නාවික පුද්ගලයන්ගේ පාරිතෝෂිකය ගණනය කිරීම

| | | | |
|---|---|---|---|
| මාසික ඒකාබද්ධ වැටුප | රු. | - | 31,407.00 |
| සලාක දීමනාව | රු. | - | 19,350.10 |
| සුදුසුකම් දීමනාව | රු. | - | 425.00 |
| එකතුව | රු. | - | 51,182.10 |

පාරිතෝෂිකය ගණනය කිරීම - රු. 51,182.10 x 12 = 614,185.20

# වසර 13 ක් සම්පූර්ණ කර සේවයේ යෙදී සිටියදී මියයන නාවික පුද්ගලයන්ගේ මරණ පාරිතෝෂිකය ගණනය කිරීම

| | | | |
|---|---|---|---|
| මාසික ඒකාබද්ධ වැටුප | රු. | - | 32,089.00 |
| සලාක දීමනාව | රු. | - | 19,350.60 |
| ය.හැ.ලා දීමනාව | රු. | - | 81.00 |
| සුදුසුකම් දීමනාව | රු. | - | 425.00 |
| එකතුව | රු. | - | 51,945.60 |

අදාළ කරගත යුතු ප්‍රතිශතය 76%

මරණ පාරිතෝෂිකය = 51,945.60 x 76% x 24 = Rs. 947,487.74

# යැපීම් දීමනාව

1. යම් නාවික පුද්ගලයෙකු සේවයේ යෙදී සිටියදී මියයන අවස්ථාවක ඔහුගේ මියයෑම රාජකාරියට සම්බන්ධ බවට නාවික හමුදාධිපති විසින් පත්කරණු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් තහවුරු කරන්නේ නම් සහ එය නාවික හමුදාධිපති තුමා විසින් අනුමත කරන්නේ නම් එම නාවිකයාගේ ඇවෑමෙන් පසු ඔහුගේ යැපෙන්නන් වෙත 1981 නාවික හමුදා විශ්‍රාම වැටුප් පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයේ විදි විධානයන්ට අනුව යැපීම් දීමනාව ගෙවීම් කරණු ලබයි.

2. යැපීම් දීමනාව ගෙවීම් කිරීමට අදාල ගණනය කිරීම් එක් එක් නාවික පුද්ගලයාගේ නිලය/තරාතිරමට අනුව වාර්ෂිකව දක්වා ඇති අතර ඒ අනුව ගෙවීම් කරණු ලැබේ.

1. වසර 10 ට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර සේවයෙන් ඉවත්ව යන හෝ සේවයෙන් ඉවත් කරන නාවික පුද්ගලයින් හට ඔවුන්ගේ සේවා කාලය තුලදී මාසික ඒකාබද්ධ වැටුපෙන් අයකර ගන්නා ලද වැන්දඹු හා අනත්දරු දායක මුදල් පමණක් ගෙවීම් කරණු ලැබේ.

2. මෙහිදි විවාහක නාවික පුද්ගලයෙකු නම් ඔහුගෙන් සේවා කාලය තුලදී අයකරන ලද මුදල් පමණක් ගෙවීම් කරන අතර, අවිවාහක නම් අයකරගත් මුදලට 2.5% ක වාර්ෂික වැල් පොලියක් එක්කර ගෙවීම් කරනු ලැබේ.

# වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප

# වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අනපනත්

1. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප සැකසීම (1970 අංක. 18 දරණ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සන්නද්ධ බලසේනා පනත) සහ එම සංශෝධන.

2. වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සැකසීම (1998 අංක. 60 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සන්නද්ධ බලසේනා පනත) සහ එම සංශෝධන.

3. දරුවන් නොමැති වැන්දඹුවක් නැවත විවාහ ගිවිස ගැනීමෙන් පසු ඇයවෙත වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපෙන් 50% හිමි ගැන්වීම (13/2010 දරණ විශ්‍රාම වැටුප් චක්‍රලේඛය).

4. ත්‍රස්ථවාදී ක්‍රියා හේතුවෙන් මියගිය නාවික පුද්ගලයින්ගේ වයස අවුරුදු 55 දක්වා වැටුප් ගෙවනු ලබන අතර එම වයස සම්පූර්ණ වීමෙන් පසු අවසන් වරට ගෙවනු ලබන වැටුප පදනම් කර ගනිමින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප 85% ප්‍රතිශතයට සංශෝධනය කිරිම (13/2010 දරණ විශ්‍රාම වැටුප් චක්‍රලේඛය).

5. වසර 10 ක් සම්පූර්ණ කර විවාහක මට්ටමෙන් සේවයෙන් ඉවත්ව ගිය නාවික පුද්ගලයින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායක කර ගැනීම (13/2010 දරණ විශ්‍රාම වැටුප් චක්‍රලේඛය).

6. වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර අවිවාහක මට්ටමෙන් සේවයෙන් ඉවත්ව යන නාවික පුද්ගලයින්ගේ වැන්දඹු හා අනත්දරු දායක මුදල් නැවත ගෙවීම් කිරීම 1970 අංක. 18 දරණ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සන්නද්ධ බලසේනා පනතේ 33 (1)

7. සේවයේ යෙදී සිටියදී මියයන අවිවාහක නාවික පුද්ගලයින්ගේ යැපෙන්නන් වෙත වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප දායක මුදල් නැවත ගෙවීම් කිරීම 1970 අංක. 18 දරණ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සන්නද්ධ බලසේනා පනතේ 33 (1).

# වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප සැකසීම සඳහා තිබිය යුතු සුදුසුකම්

1. සේවා කාලය තුළදී වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා දායක මුදල් අයවී තිබීම.

2. සේවා කාලය තුළදී විවාහ ගිවිසගෙන තිබීම. (විශේෂ ක්‍රමය යටතේ බැඳුනු නාවික පුද්ගලයින් සඳහා අදාල නොවේ.

## වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම් ලාභීන්

1. සේවයේ යෙදී සිටියදී මියයන නාවික පුද්ගලයින්ගේ බිරිද හෝ වයස අවුරුදු 26 ට අඩු අවිවාහක අනත්දරුවන්.

2. සේවයෙන් විශ්‍රාම ගන්වා ඇති විවාහක නාවික පුද්ගලයිකු මියගිය හොත් ඔහුගේ බිරිද හෝ වයස අවුරුදු 26 ට අඩු අවිවාහක අනත්දරුවන්.

3. සේවයේ යෙදී සිටියදී මියයන කාන්තා නාවිකයන්ගේ වැන්දඹු පුරුෂයන් හෝ වයස අවුරුදු 26 ට අඩු අවිවාහක අනත්දරුවන්.

4. සේවයෙන් විශ්‍රාම ගන්වා ඇති විවාහක කාන්තා නාවිකයෙකු මියගිය හොත් ඇයගේ ස්වාමිපුරුෂයා හෝ වයස අවුරුදු 26 ට අඩු අවිවාහක අනත්දරුවන්.

# වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප සකසන ආකාරය (නාවිකයින්)

| | | |
|---|---|---|
| මාසික ඒකාබද්ධ වැටුප | රු. | 15,805.00 |
| සලාක දීමනාව | රු. | 13,500.00 |
| සුදුසුකම් වැටුප | රු. | 425.00 |
| යහපත් හැසිරීමේ දීමනාව | රු. | 57.50 |
| නැවත සේවයට බැඳීමේ දීමනාව | රු. | 300.00 |
| එකතුව රු. | | 30,187.50 |

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප
ගණනය කිරීම 30,187.50 x 70% = Rs. 21,131.25

වැන්දඹුවට හිමි මාසික වැ.අ.වි.වැ = Rs. 21,131.25

# වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප සකසන ආකාරය (නිලධාරීන්)

| | | |
|---|---|---|
| මාසික ඒකාබද්ධ වැටුප | රු. | 31,320.00 |
| සලාක දීමනාව | රු. | 16,138.20 |
| සුදුසුකම් වැටුප | රු. | 637.50 |
| එකතුව | රු. | 48,095.70 |

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප
ගණනය කිරීම 48,095.70 x 65% = Rs. 31,262.20

වැන්දඹුවට හිමි මාසික වැ.අ.වි.වැ. = Rs. 31,262.20

# THANK YOU